| පිනෝල් සාදන ඵලය | ඇනිලීන් සාදන ඵලය |

ii . $CH_3COCl$

| | |
|---|---|
| | |
| පිනෝල් සාදන ඵලය | ඇනිලීන් සාදන ඵලය |

iii. ඉහත (i) සහ (ii) දී සිදු කරන ප්‍රතික්‍රියාව යාන්ත්‍රණය වර්ගය අනුව නම් කරන්න.

(i) ...................................................................... (ii) ......................................................................

iv. ෆීනෝල් සහ $CH_3COCl$ අතර ප්‍රතික්‍රියාවට අදාල යාන්ත්‍රණය ලියන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

(b) පියවර ගණන 7ට නොවැඩි ක්‍රමයකින් 

වලින් ආරම්භ කර 

යන සංයෝගය සංශ්ලේෂණය කරන්න.

(c) i පහත එක් එක් අවස්ථාවල දී ලැබෙන ප්‍රධාන කාබනික ඵලයේ ව්‍යුහය ලියන්න.

1. 


2. $C_6H_5 - CH = CH - CH_3 \xrightarrow{HBr}$

3. $C_6H_5\,COOH \xrightarrow{CH_3MgBr}$

4. $C_6H_5\,CONH_2 \xrightarrow{P_2O_5\,/\,\Delta}$

5. 

**රසායන විද්‍යාව - 2019 - 13 ශ්‍රේණිය**

**B - කොටස**

**● මෙම කොටසින් කැමති ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

(05) (a) (i) පහත දැක්වෙන බෝන් හේබර් චක්‍රය $Na_2O$ වල දැලිස එන්තැල්පිය ගණනය කිරීමට යොදා ගත හැකිය.




1. $Na_2O$ හි සම්මත දැලිස් එන්තැල්පිය නිරූපණය කිරීමට අදාළ තුලිත රසායනික සමීකරණය ලියන්න.
2. භෞතික අවස්ථා දෙමින් ඉහත A හා B ප්‍රභේද හඳුනාගන්න.
3. ඉහත (1) - (5) දක්වා පෙන්වමින් ඇති එන්තැල්පි විපර්යාස හඳුන්වන්න.

(ii) ඉහත බෝන්- හේබර් චක්‍රය හා පහත දක්වා ඇති දත්ත උපයෝගී කරගෙන $Na_2O$ හි දැලිස එන්තැල්පිය ගණනය කරන්න.

$Na(s)$ හි පරමාණුකරණ එන්තැල්පිය $+107\ kJmol^{-1}$

ඔක්සිජන්හි පළමු ඉලෙක්ට්‍රෝන ලබා ගැනීමේ එන්තැල්පිය $+141\ kJmol^{-1}$

ඔක්සිජන්හි දෙවන ඉලෙක්ට්‍රෝන ලබා ගැනීමේ එන්තැල්පිය $+798\ kJmol^{-1}$

$Na_2O\ (s)$ හි උත්පාදන එන්තැල්පිය $-414\ kJmol^{-1}$

Na හි පළමු අයණීකරණ එන්තැල්පිය $+494\ kJmol^{-1}$

$O_2$ හි බන්ධන විඝටන එන්තැල්පිය $+496\ kJmol^{-1}$

(iii) $MgO(s)$ දැලිස එන්තැල්පියෙහි විශාලත්වය $Na_2O\ (s)$ දැලිස එන්තැල්පියට සාපේක්ෂව ඔබ සසඳන ආකාරය හේතු සහිතව පහදන්න.

(b) නිශ්චිත තත්ත්ව යටතේ ඇති $N_2$ , $O_2$ හා $NH_3$ හි සමතුලිත ආංශික පීඩනය පහත දක්වා ඇත.

$N_2(g)$ 44.8 atm , $H_2(g)$ 105.6 atm , $NH_3(g)$ 37.2 atm

$$N_2(g) + 3H_2(g) \rightleftharpoons 2NH_3(g)$$

(i) හේබර් ක්‍රමයෙන් $NH_3$ නිපදවීමේ දී සමතුලිතතා නියතය $K_p$ සඳහා ප්‍රකාශනයක් ලියන්න.

(ii) ඉහත දක්වා ඇති දත්ත උපයෝගී කරගෙන අදාල ඒකක සමඟ $K_p$ සඳහා අගය ගණනය කරන්න.

(c) එක්තරා නිශ්චිත උෂ්ණත්වයක දී පහත රසායනික ප්‍රතික්‍රියාව සඳහා සමතුලිතතා නියතය $K_C$ හි අගය 16 වේ.

$SO_2(g) + NO_2(g) \rightleftharpoons SO_3(g) + NO(g)$

$1\ dm^3$ ක සංවෘත බඳුනක් තුලට ඉහත සෑම වායුවක්ම $1\ mol$ බැගින් ඇතුල් කළේ නම් වායු සමතුලිතතා අවස්ථාවේ දී $NO\ (g)$ හා $NO_2(g)$හි සමතුලිත සාන්ද්‍රණ $mol\ dm^{-3}$ වලින් ගණනය කරන්න.

(06) (a) ඉන්දියාවේ පිහිටි ටජ් මහල් වැනි කිරිගරුඬ හා හුණුගල් ස්මාරක අම්ල වැසි නිසා ඛාදනයට ලක්වෙමින් පවතී. මෙම අම්ල වැසි මගින් එහි වූ කාබනේටය සාපේක්ෂව වඩා ද්‍රාව්‍ය සල්පේටය බවට පත් කෙරේ. ඒ සඳහා ප්‍රතික්‍රියාව පහත දැක්වේ.

$CaCO_3(s) + H_2SO_4(aq) \longrightarrow CaSO_4(s) + H_2O(l) + CO_2(g)$

(i) $CaSO_4$ හි ද්‍රාව්‍යතා ගුණිතය සඳහා Ksp ප්‍රකාශනයක් ලියන්න. Ksp සඳහා ඒකකය ද දෙන්න.

(ii) ඉහත ප්‍රතික්‍රියා සිදුවන උෂ්ණත්වයේ දී $CaSO_4$ හි Ksp සඳහා වන සංඛ්‍යාත්මක අගය $3 \times 10^{-5}$වේ. ඉහත ප්‍රකාශනය භාවිතා කර $CaSO_4$ වලින් සංතෘප්ත ජලීය ද්‍රාවණයක $SO_4^{2-}$ අයන සාන්ද්‍රණය ගණනය කරන්න.

(iv) ඉහත උෂ්ණත්වයේ දී අම්ල වැසි $100dm^3$ පරිමාවක් කුඩා ස්මාරකයක් මත වැටුණු විට එහි සිදුවන ස්කන්ධ හානිය ගණනය කරන්න. මෙහිදී ස්මාරකය සංශුද්ධ $CaCO_3$ වලින් සෑදි ඇති බවත් ඛාදනය හේතුවෙන් අම්ල වැස්ස $CaSO_4$ වලින් සංතෘප්ත වන බවත් උපකල්පනය කරන්න.

$(Ca - 40,\ S - 32,\ O - 16)$

(b) මෙවන් ස්මාරක වල ආයු කාලය දීර්ඝ කිරීමට ඒවා යූරියා සහ $Ba(OH)_2$ මිශ්‍රණයකින් පිරියම් කරනු ලැබේ. එය කාබනේට පාෂාණයේ කුඩා සිදුරු තුලින් ඇතුළු වීමෙන් පසු යූරියා ක්‍රමයෙන් $NH_3$ සහ $CO_2$ බවට වියෝජනය වේ. මෙම $CO_2$ , $Ba(OH)_2$ සමඟ ප්‍රතික්‍රියා කර $BaCO_3$ සාදයි. සිදුවන ප්‍රතික්‍රියා පහත දැක්වේ.

$(NH_2)_2CO(aq) + H_2O\ (l) \longrightarrow 2NH_3(g) + CO_2(g)$

$Ba(OH)_2(aq) + CO_2(g) \longrightarrow BaCO_3(s) + H_2O\ (l)$

පසුව අම්ල වැස්ස මගින් මෙම $BaCO_3$ එහි සල්පේටය බවට පත් කෙරේ.

$BaCO_3\ (s) + H_2SO_4\ (aq) \rightarrow BaSO_4(s) + H_2O\ (l) + CO_2(g)$

$CaSO_4$ ට සාපේක්ෂව $BaSO_4$ වල ද්‍රාව්‍යතාව ඉතා අඩුයි. මෙම උෂ්ණත්වයේ දී සංශුද්ධ $BaSO_4$ වලින් සංතෘප්ත ද්‍රාවණයක,

$[Ba^{2+}] = 9 \times 10^{-6}\ moldm^{-3}$ වේ.

(i) $CaSO_4$ ට සාපේක්ෂව $BaSO_4$ හි ද්‍රාව්‍යතාව ඉතා අඩු වීමට හේතුව ද්‍රාවණ එන්තැල්පිය ඇසුරින් පැහැදිලි කරන්න.

(ii) $BaSO_4$ හි Ksp සඳහා ප්‍රකාශනය ලියා ඉහත දත්ත භාවිතා කර එහි අගය ගණනය කරන්න. ඒකක සඳහන් කරන්න.

(c) (i) මෙතනොයික් අම්ලය $(HCOOH) ka = 1.77 \times 10^{-4} moldm^{-3}$ වන දුබල අම්ලයකි.

1. HCOOH වල Ka සඳහා ප්‍රකාශනයක් ලියන්න.
2. එම ප්‍රකාශනය භාවිතයෙන් $0.05moldm^{-3}$ HCOOH ද්‍රාවණයක $[H^+(aq)]$ගණනය කරන්න.
3. ද්‍රාවණය තුල අයනීකරණය වී ඇති HCOOH අණුවල ප්‍රතිශතය ගණනය කරන්න.
4. ද්‍රාවණයේ pH අගය ගණනය කරන්න.

(ii) HCOOH මෙන්ම HCl අම්ලය ද Mg ලෝහ කුඩු සමඟ ප්‍රතික්‍රියා කරයි.

1. HCOOH හා Mg අතර ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.
2. මෙම අම්ල දෙකෙන්ම $0.05\ moldm^{-3}$ හි $20\ cm^3$ ක පරිමා දෙකක් ගෙන වෙන වෙනම වැඩිපුර Mg කුඩු සමඟ ප්‍රතික්‍රියා කරවූ විට සමාන $H_2(g)$ පරිමාවක් පිටවිය. එහෙත් HCl අම්ලයට සාපේක්ෂව HCOOH වල ප්‍රතික්‍රියා සීඝ්‍රතාවය ඉතා අඩුයි. පිටවන $H_2(g)$ පරිමාව ගණනය කරන්න.
(සම්මත උෂ්ණත්ව පීඩනයේ දී $V_m = 22.4\ dm^{-3}\ mol^{-1}$)
3. HCl අම්ලයට සාපේක්ෂව HCOOH හි ප්‍රතික්‍රියා සීඝ්‍රතාව ඉතා අඩුවීමට හේතුව පැහැදිලි කරන්න.
4. අවසානයේ දී H COOH මඟින් මෙන්ම HCl මඟින් ද සමාන වායු පරිමාවෙන් පිට කිරීමට හේතුව පැහැදිලි කරන්න.

(07) (a) පැස්සිම් කටයුතු වල දී යොදා ගන්නා බාල වර්ගයේ මිශ්‍ර ලෝහ සාම්පලයක් Pb සඳහා විශ්ලේෂණය කරන ලදී. එම සාම්පලයෙන් 0.759g අම්ලයක දියකර $Pb^{2+}$ ද්‍රාවණයක් සාදා එයට වැඩිපුර $K_2CrO_4$ ද්‍රාවණයක් එක් කර එහි ඇති සියලුම $Pb^{2+}$ , $PbCrO_4$ ලෙස අවශේෂ කර ගන්නා ලදී. ඉන්පසු අවක්ෂේපය පෙරා සෝදා ඉන්පසුව නැවත අම්ලයක දිය කරන ලදී. මෙම ද්‍රාවණය වැඩිපුර KI සමඟ පිරියම් කිරීමෙන් පසු (KI හා $CrO_4^{2-}$ අතර ප්‍රතික්‍රියාවෙන්) නිදහස් වන $I_2$ $0.051moldm^{-3}$ $Na_2S_2O_3$ ද්‍රාවණයක් සමඟ අනුමාපනය කරන ලදී. අනුමාපනය සඳහා $Na_2S_2O_3$ ද්‍රාවණ $11.22\ cm^3$ ක් වැය විය.

(i) ඉහත සියලු ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.
(ii) මෙම මිශ්‍ර ලෝහයේ ඇති Pb ස්කන්ධ ප්‍රතිශතය ගණනය කරන්න.

(b) (i) 'සම්මත හයිඩ්‍රජන් ඉලෙක්ට්‍රෝඩය' යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
(ii) සම්මත හයිඩ්‍රජන් ඉලෙක්ට්‍රෝඩයෙන් ලවණ සේතුවක් මඟින් සම්මත Zn ඉලෙක්ට්‍රෝඩයකට සම්බන්ධ කර සාදා ගත් විද්‍යුත් කෝෂයක් සම්බන්ධ පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. ඇනෝඩය සහ කැතෝඩය සඳහන් කරන්න.
2. කෝෂයේ අග්‍ර දෙක සම්බන්ධ කර නොමැති විට එක් එක් ඉලෙක්ට්‍රෝඩයේ සිදුවන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.
3. ඉහත කෝෂයේ ධාරාවක් ලබා ගන්නා විට සිදුවන කෝෂ ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.
4. ඉහත කොෂය සඳහා කෝෂ සටහන සම්මත ආකාරයට ලියන්න.
5. සම්මත Zn ඉලෙක්ට්‍රෝඩයේ $E^{\theta}$ අගය $-0.76\ v$ වේ නම් ඉහත කෝෂයේ විද්‍යුත් ගාමක බලය ගණනය කරන්න.
6. ඉහත විද්‍යුත් කෝෂයේ වි.ගා.බ. වැඩි කර ගැනීම සඳහා උචිත ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න.

(c) $27^0C$ දී A(l) සහ B(l) එකතු වී සාදන පරිපූර්ණ ද්‍රාවණයක් එහි වාෂ්පය සමඟ සමතුලිතව පවතී. එම උෂ්ණත්වයේ දී සංශුද්ධ A හි සංතෘප්ත වාෂ්ප පීඩනය $4 \times 10^5 Pa$ වන අතර සංශුද්ධ B හි සන්තෘප්ත වාෂ්ප පීඩනය $2.5 \times 10^5 Pa$ වේ. වාෂ්ප කලාපයේ සමස්ථ පීඩනය $3 \times 10^5 Pa$ වේ.

(i) ඉහත ද්‍රාවණයේ පරිපූර්ණ හැසුරුම අන්තර් අණුක ක්‍රියා අනුසාරයෙන් පැහැදිලි කරන්න.
(ii) සමතුලිත විට ද්‍රව කලාපයේ A සහ B වල සංයුතිය ගණනය කරන්න. යොදා ගන්නා උපකල්පන ද සඳහන් කරන්න.
(iii) සමතුලිත වන විට වාෂ්ප කලාපයේ සංයුතිය ගණනය කරන්න.
(iv) ඉහත පරිපූර්ණ ද්‍රාවණයට අදාලව නියත පීඩනයේදී උෂ්ණත්ව සංයුතිය විචලන කලාප සටහන ඇඳ නම් කරන්න.
(v) A සහ B අඩංගු මිශ්‍රණයක් වෙන් කර ගැනීමට යොදා ගන්නා ශිල්පීය ක්‍රමය සඳහන් කරන්න.

## C - කොටස

- **ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට ලකුණු 15 බැගින් ලැබේ.)**

(08) (a) පහත දී ඇති පරිවර්තනයේ A සිට G දක්වා ඇති සංයෝගවල ව්‍යුහ හා $R_1$ සිට $R_2$ දක්වා ඇති ප්‍රතිකාරකයන් සඳහන් කරන්න.




(b) පියවර සංඛ්‍යාව 6 ට නොවැඩි ක්‍රමයකින් ආරම්භක කාබනික සයෝගය ලෙස $C_2H_4$ යොදාගෙන

$$CH_3CH_2 - \overset{\overset{\displaystyle O}{||}}{C} - CH_3$$

යන සංයෝගය සංශ්ලේසණය කරන්න.

(c) පහත දැක්වෙන සංයෝග රසායනික පරීක්ෂා මඟින් වෙන්කර හඳුනා ගන්නේ කෙසේද?

(i) $C_2H_5OH$ සහ $CH_3CH_2CH_2OH$

(ii) $CH_3NH_2$ සහ $CH_3CONH_2$

(iii) $C_6H_5CHO$ සහ $C_6H_5COCH_3$

(09) (a) $A$ හා $B$ යනු ජලයේ ද්‍රාව්‍ය ඝන සංයෝග දෙකකි. එහි ඇති කැටායන දෙක හඳුනා ගැනීම සඳහා කර ලද පරීක්ෂාවල නිරීක්ෂණ පහත දී ඇත.

| පරීක්ෂණය | නිරීක්ෂණ |
|---|---|
| (1) A හි ජලීය ද්‍රාවණයකට NaOH ස්වල්පයක් එකතු කිරීම. | වැඩිපුර NaOH වල අද්‍රාව්‍ය නමුත් $NH_4OH$ වල ද්‍රාව්‍ය කලු දුඹුරු පාට අවක්ෂේපයක් ලැබුණි. |
| (2) A හි ජලීය ද්‍රාවණ කොටසකට තනුක HCl එකතු කිරීම. | උණු ජලයේ අද්‍රාව්‍ය සුදු අවක්ෂේපයක් ලැබුණි. නමුත් එය තනුක $NH_4OH$ වල ද්‍රාව්‍ය විය. |
| (3) B හි ජලීය ද්‍රාවණයකට NaOH ස්වල්පයක් එකතු කරන ලදී. | වැඩිපුර NaOH වල ද්‍රාව්‍ය සුදුපාට අවක්ෂේපයක් ලැබුණි. |
| (4) B හි ජලීය ද්‍රාවණයකට $NH_4OH$ ස්වල්පයක් එකතු කිරීම. | වැඩිපුර $NH_4OH$ වල අද්‍රාව්‍ය සුදුපාට අවක්ෂේපයක් ලැබුණි. |
| (5) B හි ජලීය ද්‍රාවණයකට තනුක HCl දමා $H_2S(g)$ යවන ලදී. | නිරීක්ෂණයක් නැත. |
| (6) ඉහත (5) දී ලැබෙන ද්‍රාවණය රත් කර නටවා පසුව එයට $NH_4Cl$ සහ $NH_4OH$ එකතු කරන ලදී. | සුදු ජෙලටින් වැනි අවක්ෂේපයක් ලැබුණි. |

(i) A සහ B ඇති කැටායන දෙක හඳුනාගන්න.
(ii) ඉහත පරීක්ෂා 1 සහ 3 දී ලැබෙන අවක්ෂේපවල රසායනික සූත්‍ර ලියන්න.

(b) පොස්පරස්, සල්පර් සහ ක්ලෝරීන් යන මූල ද්‍රව්‍ය සම්බන්ධයෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
(i) එක් එක් මූල ද්‍රව්‍ය ස්වභාවයේ පවතින අණුක ආකාරය සඳහන් කරන්න.
(ii) ඉහත මූල ද්‍රව්‍ය තුන ඒවායේ ද්‍රවාංකය වැඩිවන පිළිවලට සකස්කරන්න.
(iii) ඉහත (ii) හි සඳහන් පිළිතුරට හේතුව කුමක්ද?
(iv) ඉහත මූල ද්‍රව්‍ය තුන සාදන හයිඩ්‍රයිඩ වල රසායනික සූත්‍රය ලියන්න එය ඉදිරියේ එහි රසායනික ගුණය දුබල ආම්ලික / දුබල භාස්මික / ප්‍රබල ආම්ලික / ප්‍රබල භාස්මික ලෙස දක්වන්න.
(v) සල්පර් මූලද්‍රව්‍ය පහත සඳහන් දෑ සමඟ සිදුකරන ප්‍රතික්‍රියා සඳහා තුලිත සමීකරණය ලියන්න.
1. NaOH (aq) 1. උණු සාන්ද්‍ර $H_2SO_4$
(vi) ක්ලෝරීන් පහත සඳහන් දෑ සමඟ සිදුකරන ප්‍රතික්‍රියා සඳහා තුලිත සමීකරණය ලියන්න.
1. උණු සාන්ද්‍ර KOH 1. වැඩිපුර $NH_3$ (g)

(c) (i) II කාණ්ඩයේ මූල ද්‍රව්‍ය සාදන සල්ෆේට වල ජල ද්‍රාව්‍යතාවය අනුව අඩුවන පිළිවෙල සඳහන් කර ඊට හේතුව පැහැදිලි කරන්න.
(ii) LiF, LiCl, LiBr, LiI යන සංයෝගවල ද්‍රවාංකය වැඩිවන පිළිවෙල දක්වා ඊට හේතුව සඳහන් කරන්න.

(10) (a) $H_2SO_4$ නිපදවන කර්මාන්තශාලායකින් ඉවත්වන අප ජලයේ අම්ලයෙන් දූෂණය වී ඇති බවට කර්මාන්ත ශාලාව අවට වෙසෙන මහජනයා විසින් මධ්‍යම පරිසර අධිකාරියට පැමිණිලි කරන ලදී පසුව එය පරීක්ෂා කිරීම සඳහා අප ජලයෙන් $50 cm^3$ ක් ගෙන එය ආස්‍රැත ජලය එකතු කර $500 cm^3$ දක්වා තනුක කරන ලදී. එම තනුක ද්‍රාවණයෙන් ලබා ගත් $25 cm^3$ ක ඇති $H^+$ සියල්ලම සමඟ ප්‍රතික්‍රියා කිරීමට වැඩිපුර ඇති $KIO_3$ සහ KI වල 0.2 g ක් එකතු කරන ලදී. එහිදී සාන්ද්‍ර අයඩින් සමඟ සම්පූර්ණයෙන් ම ප්‍රතික්‍රියා කිරීම සඳහා $0.1 moldm^{-3}$ $Na_2S_2O_3$ ද්‍රාවණයකින් $20 cm^3$ ක් අවශ්‍ය විය.
(i) මෙහිදී සිදුවන ප්‍රතික්‍රියා සඳහා තුලිත සමීකරණය ලියන්න.
(ii) එම අපජලයේ ඇති $H^+$ සාන්ද්‍රණය ගණනය කරන්න.

(b) පහත දැක්වෙන එක් එක් ලෝහ කැටායනය දී ඇති එක් එක් ලිගනය හා සම්බන්ධ වී සාදන සංකීර්ණ අයනවල රසායනික සූත්‍රය සහ එහි වර්ණය සඳහන් කරන්න.

| කැටායනය | | සංකීර්ණ අයනය | වර්ණය |
|---|---|---|---|
| (1) $Cr^{3+}$ | $Cl^-$ | | |
| (2) $Fe^{3+}$ | $H_2O$ | | |
| (3) $CO^{3+}$ | $NH_3$ | | |
| (4) $CO^{2+}$ | $Cl^-$ | | |
| (5) $Cu^{2+}$ | $NH_3$ | | |

(c) A යනු එක් ඇනායනයක් කැටායන දෙකක සමඟ බැඳී සෑදෙන අකාබනික සංයෝග දෙකක මිශ්‍ර ලවණයකි. (ද්විත්ව ලවණයකි) එහි ඇති කැටායන දෙක හා ඇනායනය හඳුනා ගැනීම සඳහා කරන ලද පරීක්ෂණ සහ ඒවායේ නිරීක්ෂණ පහත දී ඇත.




(i) A හි ඇති කැටායන දෙක සහ ඇනායනය හඳුනාගෙන ඒවායේ සූත්‍ර ලියන්න.

(ii) C, J, K හි ඇති රසායනික වේශ්ෂ වල සූත්‍ර ලියන්න.

(iii) B හා H හි වර්ණයට හේතුවන සංගත සංකීර්ණ වල සූත්‍ර ලියන්න.

(iv) F සහ G හි ඇති අවක්ෂේප වල රසායනික සූත්‍ර ලියන්න.

(v) B සහ NaOH අතර ප්‍රතික්‍රියාවේ H සහ Zn කුඩු අතර ප්‍රතික්‍රියාවට තුලිත සමීකරණය ලියන්න.

**ආවර්තිතා වගුව**
**ஆவர்த்தன அட்டவணை**
**Periodic Table**

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 H | | | | | | | | | | | | | | | | | 2 He |
| 2 | 3 Li | 4 Be | | | | | | | | | | | 5 B | 6 C | 7 N | 8 O | 9 F | 10 Ne |
| 3 | 11 Na | 12 Mg | | | | | | | | | | | 13 Al | 14 Si | 15 P | 16 S | 17 Cl | 18 Ar |
| 4 | 19 K | 20 Ca | 21 Sc | 22 Ti | 23 V | 24 Cr | 25 Mn | 26 Fe | 27 Co | 28 Ni | 29 Cu | 30 Zn | 31 Ga | 32 Ge | 33 As | 34 Se | 35 Br | 36 Kr |
| 5 | 37 Rb | 38 Sr | 39 Y | 40 Zr | 41 Nb | 42 Mo | 43 Tc | 44 Ru | 45 Rh | 46 Pd | 47 Ag | 48 Cd | 49 In | 50 Sn | 51 Sb | 52 Te | 53 I | 54 Xe |
| 6 | 55 Cs | 56 Ba | La-Lu | 72 Hf | 73 Ta | 74 W | 75 Re | 76 Os | 77 Ir | 78 Pt | 79 Au | 80 Hg | 81 Tl | 82 Pb | 83 Bi | 84 Po | 85 At | 86 Rn |
| 7 | 87 Fr | 88 Ra | Ac-Lr | 104 Rf | 105 Db | 106 Sg | 107 Bh | 108 Hs | 109 Mt | 110 Uun | 111 Uuu | 112 Uub | 113 Uut | | | | | |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 57 La | 58 Ce | 59 Pr | 60 Nd | 61 Pm | 62 Sm | 63 Eu | 64 Gd | 65 Tb | 66 Dy | 67 Ho | 68 Er | 69 Tm | 70 Yb | 71 Lu |
| 89 Ac | 90 Th | 91 Pa | 92 U | 93 Np | 94 Pu | 95 Am | 96 Cm | 97 Bk | 98 Cf | 99 Es | 100 Fm | 101 Md | 102 No | 103 Lr |

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**දෙවන වාර පරීක්ෂණය - 2019 - 13 ශ්‍රේණිය**

## රසායන විද්‍යාව I

| | | | | |
|---|---|---|---|---|
| (1) 3 | (11) 4 | (21) 4 | (31) 4 | (41) 3 |
| (2) 1 | (12) 5 | (22) 2 | (32) 5 | (42) 1 |
| (3) 4 | (13) 1 | (23) 3 | (33) 4 | (43) 1 |
| (4) 2 | (14) 3 | (24) 3 | (34) 3 | (44) 4 |
| (5) 2 | (15) 1 | (25) 4 | (35) 5 | (45) 5 |
| (6) 3 | (16) 4 | (26) 1 | (36) 4 | (46) 1 |
| (7) 2 | (17) 1 | (27) 3 | (37) 5 | (47) 4 |
| (8) 5 | (18) 5 | (28) 5 | (38) 4 | (48) 3 |
| (9) 3 | (19) 5 | (29) 2 | (39) 5 | (49) 3 |
| (10) 2 | (20) 2 | (30) 3 | (40) 4 | (50) 5 |

## රසායන විද්‍යාව II

## A කොටස ව්‍යුහගත කොටස

(1) (a) I

| | $NO_2$ | $NO_2F$ | $NH_2OH$ | $N_2O$ | $NH_4^+$ |
|---|---|---|---|---|---|
| ඔක්සිකරණ අංකය | +4 | +5 | −1 | +2 | −3 |
| මුහුම්කරණය | $sp^2$ | $sp^2$ | $sp^3$ | $sp$ | $sp^3$ |

ල. 10 × 1 = (10)

ii $:N\equiv\overset{+}{N}-\overset{-}{\ddot{\underset{..}{O}}}:$  ල.(10)

iii $:\overset{-}{\ddot{N}}=\overset{+}{N}=\ddot{O}: \longleftrightarrow \overset{2-}{:\ddot{\underset{..}{N}}}-\overset{+}{N}\equiv\overset{+}{O}:$  ල. 5×2 =(10)

* − ආරෝපණය විද්‍යුත් සෘණතාවයෙන් අඩු පරමාණුව මත පවතී.
* ∴ ස්ථායී නොවේ :

ල.(02)

* ආරෝපණ වෙන්වීම වැඩියි.
* යාබද පරමාණු මත සමාන ආරෝපණ ඇත.
* O පරමාණුව මත + ආරෝපණය ඇත.

∴ ස්ථායී නොවේ.

ල.(03)

(b) i potassium hydrogen difluoride  ල.(10)

ii කැටායනය $K^+$

ඇනායනය $HF_2^-$  ල.(02×2)

iii $F^- - - - H^{\delta+} - F^{\delta-}$  ල.(05)

බන්ධන වර්ග
* හයිඩ්‍රජන් බන්ධන
* ධ්‍රැවීය සහසංයුජ බන්ධන.  ල. 2×2 =(04)

iv 1 $H_2S$ වල
* ද්විධ්‍රැව - ද්විධ්‍රැව අන්තර් ක්‍රියා
* විසරණ බල  ල. 2×2 =(04)

$CS_2$ වල * විසරණ බල  ල.(2)

2 $CS_2$ —— (5)

3 $CS_2$ —— (5)

4 $2H_2S + 3O_2 \longrightarrow 2H_2O + 2SO_2$

$CS_2 + 3O_2 \longrightarrow CO_2 + 2SO_2$  ල. 5×2 =(10)

C i සත්‍යයි ii අසත්‍යයි iii සත්‍යයි iv අසත්‍යයි v සත්‍යයි
vi අසත්‍යයි vii අසත්‍යයි viii සත්‍යයි @ 02 × 8 = (16)

(2) a i $M = Mg$ @ (10)

ii $Q_1 = MgO$ $Q_2 = Mg_3N_2$ @ (10)

iii 1 $Mg + 2H_2O \longrightarrow Mg(OH)_2 + H_2$

2 $Mg_3N_2 + 6H_2O \longrightarrow 3Mg(OH)_2 + 2NH_3$ @ (10)

iv 1.0 g ක ඇති $Q_2$ ස්කන්ධය $= \frac{0.303 \times 1}{100} = 0.303\ g$ ✓

$Q_2$ මවුල ගණන $= \frac{0.303\ g}{100\ g\ mol^{-1}} = 0.00303\ mol$ ✓

$Mg_3N_2 : NH_3$

$1 : 2$ ✓

∴ විය $NH_3$ මවුල ගණන $= 0.00606\ mol$ ✓

$NH_3 + HCl \longrightarrow NH_4Cl$ ✓

$1 : 1$

∴ අවශ්‍ය $n_{HCl} = 0.00606\ mol$ ✓

$V_{HCl} = \frac{1000\ cm^3 \times 0.00606\ mol}{0.5\ mol}$ ✓

$= 12.12\ cm^3$ ✓

@ 1 × 8 = (8)

(b) i $Y = Na_2S_2O_3$ @ (10)

ii $2Na_2S_2O_3 + I_2 \longrightarrow 2NaI + Na_2S_4O_6$

$Na_2S_2O_3 + 2HCl \longrightarrow 2NaCl + SO_2 + H_2O + S$

$Na_2S_2O_3 + 2AgNO_3 \longrightarrow Ag_2S_2O_3 + 2NaNO_3$

$Ag_2S_2O_3 + H_2O \longrightarrow Ag_2S + H_2SO_4$ @ 5 × 4 = (20)

iii $X \xrightarrow{\Delta} Y + H_2O$

| | $Y$ | $H_2O$ |
|---|---|---|
| | 2.48 − 0.9 = 1.58 ✓ | 0.9 |
| මවුල ගණන | $\frac{1.58}{158}$ ✓ | $\frac{0.9}{18}$ ✓ |
| | 0.01 | 0.05 |
| ∴ අනුපාතය | 1 : | 5 ✓ |

X හි සූත්‍රය $= Na_2S_2O_3 \cdot 5H_2O$ ✓ @ 2 × 6 = (12)

(C) i $NaNH_2 + NH_4Cl \longrightarrow 2NH_3 + NaCl$

ii $H_2S + H_2O_2 \longrightarrow S + 2H_2O$

iii $8Al + 5OH^- + 3NO_3^- \longrightarrow 8AlO_2^- + 3NH_3$

iv $2FeCl_3 + H_2S \longrightarrow 2FeCl_2 + 2HCl + S$ @ 4 × 5 = (20)

(3) (a)

i $pK_b = -\log K_b$ ✓

ii $NH_{3(aq)} + H_2O_{(l)} \rightleftharpoons NH_4^+{}_{(aq)} + OH^-{}_{(aq)}$ ✓

iii $$K_b = \frac{[NH_4^+{}_{(aq)}][OH^-{}_{(aq)}]}{[NH_{3(aq)}]}$$ ✓

iv $$K_a = \frac{[NH_{3(aq)}][H_3O^+{}_{(aq)}]}{[NH_4^+{}_{(aq)}]}$$ ✓

v $$K_a \times K_b = \frac{[NH_4^+{}_{(aq)}][OH^-{}_{(aq)}]}{[NH_{3(aq)}]} \times \frac{[NH_{3(aq)}][H_3O^+{}_{(aq)}]}{[NH_4^+{}_{(aq)}]} = [H_3O^+{}_{(aq)}][OH^-{}_{(aq)}]$$ ✓

$[H_3O^+{}_{(aq)}][OH^-{}_{(aq)}] = K_w$ ✓

$\therefore K_a \times K_b = K_w$ ✓

vi $$K_a = \frac{K_w}{K_b}$$ ✓

$$-\log K_a = -\log \frac{K_w}{K_b}$$ ✓

$pK_a = -\log K_w - \log K_b$ ✓

$= 14 - 4.8 = 9.2$ // ✓

@ $11 \times 5 = (55)$

(b) i $NaOH + HCl \longrightarrow NaCl + H_2O$ ✓

$Na_2CO_3 + HCl \longrightarrow NaHCO_3 + NaCl$ ✓

ii $2NaOH + CO_2 \longrightarrow Na_2CO_3 + H_2O$ ✓

$Na_2CO_3 + CO_2 + H_2O \longrightarrow 2NaHCO_3$ ✓

iii $NaHCO_3 + HCl \longrightarrow NaCl + H_2CO_3$ ✓

iv ආරම්භක මිශ්‍රණයේ NaOH මවුල $x$ ද $Na_2CO_3$ මවුල $y$ ද ගනිමු.

$x + y = \frac{1 \times 10}{1000}$ —— ① ✓

$x + 2y = \frac{1 \times 15}{1000}$ —— ② ✓

(2−1) ⟹ $y = 0.015 - 0.01 = 0.005$ mol // ✓

$x = 0.01 - 0.005 = 0.005$ mol // ✓

@ $9 \times 5 = (45)$

(4) (a) i



@ $6 \times 2 = (12)$

ii $C_6H_5O-\overset{O}{\overset{\|}{C}}-CH_3$ (6) $C_6H_5-\overset{H}{N}-\overset{O}{\overset{\|}{C}}-CH_3$ (5)

iii i ඉලෙක්ට්‍රොෆිලික ආදේශය.

ii න්‍යෂ්ටිෆිලික ආදේශය. $4 \times 2 = (8)$

v



@ $2 \times 8 = (16)$

(b)



@ $14 \times 2 = (28)$

(C) i $C_6H_5-\overset{O}{\overset{\|}{C}}-O-C_6H_4-NO_2$

ii $C_6H_5-\underset{Br}{CH}-CH_2CH_3$

iii $C_6H_5-COOMgBr$

iv $C_6H_5CN$

v



@ $5 \times 5 = (25)$

⑤ (a)

(i) 1) $2Na^+_{(g)} + O^{2-}_{(g)} \longrightarrow Na_2O_{(s)}$ (05)

2) $A = Na_{(g)}$ (05)
$B = O_{(g)}$ (05)

3) ① - Na හි පළමු අයනීකරණ එන්තැල්පිය (05)
② - ඔක්සිජන්හි සම්මත පළමු ඉලෙක්ට්‍රෝන ලබාගැනීමේ එන්තැල්පිය (05)
③ $Na_2O_{(s)}$ හි සම්මත දැලිස එන්තැල්පිය (05)
④ $Na_2O_{(s)}$ හි සම්මත උත්පාදන එන්තැල්පිය (05)
⑤ ඔක්සිජන් වල සම්මත දෙවන ඉලෙක්ට්‍රෝන ලබාගැනීමේ එන්තැල්පිය (05)

(අදාල එන්තැල්පි වෙනුවට සංකේත දී ඇත්නම් ලකුණු 02 බැගින් ලබාදේ)

(ii)
$$\Delta H^\theta_f\ Na_2O_{(s)} = 2\times \Delta H^\theta_{atm}\ Na_{(s)} + 2\times \Delta H^\theta_{I_1}\ Na_{(g)} + \Delta H^\theta_{atm}\ O_{(g)} + \Delta H^\theta_{EA_1}(O_{(g)}) + \Delta H^\theta_{EA_2}(O^-_{(g)}) + \Delta H^\theta_L\ Na_2O_{(s)}$$
(10)

$$-414\ kJ\ mol^{-1} = (2\times 107\ kJ\ mol^{-1}) + (2\times 494\ kJ\ mol^{-1}) + (\tfrac{1}{2}\times 496\ kJ\ mol^{-1}) + (-141\ kJ\ mol^{-1}) + 798\ kJ\ mol^{-1} + \Delta H^\theta_L\ Na_2O_{(s)}$$
(10)

$$\Delta H^\theta_L\ Na_2O_{(s)} = -2521\ kJ\ mol^{-1}$$
(10)

(iii) MgO වල දැලිස එන්තැල්පිය, $Na_2O$ හි දැලිස එන්තැල්පියට වඩා වැඩිය. (වඩාත් ඍණ වේ) (10)

හේතුව - $Mg^{2+}$, $Na^+$ ට සාපේක්ෂව දෙගුණයක් ආරෝපිත වීම හා $Mg^{2+}$ හි ආරෝපණ ඝනත්වය විශාල වීම හා සහ අරය කුඩා වීම. (10)

a [90]

(b)

(i) $$K_p = \frac{P^2_{NH_3(g)}}{P_{N_2(g)} \times P^3_{H_2(g)}}$$ (10)

(ii) $K_p = \dfrac{(37.2)^2 \text{ atm}^2}{44.8 \times (105.6)^3 \text{ atm}^4}$ (10)

$= 2.62 \times 10^{-5} \text{ atm}^{-2}$ (10)

b [30]

(c)

$SO_{2(g)} + NO_{2(g)} \rightleftharpoons SO_{3(g)} + NO_{(g)}$

| | $SO_2$ | $NO_2$ | $SO_3$ | $NO$ | |
|---|---|---|---|---|---|
| In mol | 1 | 1 | 1 | 1 | |
| Eq mol | 1-x | 1-x | 1+x | 1+x | (05) |

$K_c = \dfrac{[SO_{3(g)}][NO_{(g)}]}{[SO_{2(g)}][NO_{2(g)}]} = \dfrac{\{(1\text{ mol}+x)/1\text{ dm}^3\}^2}{\{(1\text{ mol}-x)/1\text{ dm}^3\}^2} = 16$ (10)

$\dfrac{1\text{ mol}+x}{1\text{ mol}-x} = 4$

$x = \dfrac{3}{5} = 0.6 \text{ mol}$ (05)

$[NO_{2(g)}] = 0.4 \text{ mol dm}^{-3}$ (05)

$[NO_{(g)}] = 1.6 \text{ mol dm}^{-3}$ (05)

c = 30

Q5 = 150

(06) (a) (i) $CaSO_{4(s)} \rightleftharpoons Ca^{2+}_{(aq)} + SO_4^{2-}{}_{(aq)}$ (05)

$K_{sp} = [Ca^{2+}_{aq}][SO^{2-}_{4\,aq}] \text{ mol}^2 \text{ dm}^{-6}$ (05)

(ii) $[CaSO_4] = \sqrt{K_{sp}} = \sqrt{3 \times 10^{-5} \text{ mol}^2 \text{ dm}^{-6}}$ (05)

$= 5.5 \times 10^{-3} \text{ mol dm}^{-3}$ (05)

(iii) 100 $dm^3$ ක ඇති $CaSO_4$ මවුල ගණන $= 5.5 \times 10^{-3} \times 100$ mol

$= 0.55$ mol (05)

සෑදෙන $CaCO_3$ මවුල ගණන = ද්‍රාවණයේ ඇති $CaSO_4$ මවුල ගණන

$CaCO_3$ වල මවුලික ස්කන්ධය = $100\ g\ mol^{-1}$

$CaCO_3$ වල ස්කන්ධ භාගය = $0.55 \times 100 = 55\ g$ (05)

(b) (i) ද්‍රාව්‍ය ලවණයක් ජලයේ දියවන විට දළ සාන්ද්‍රණය ✓ සහ සමතුලිත සාන්ද්‍රණය ✓ අතර වෙනසට අනුපාතිකව අවක්ෂේපනය කළ යුතුය.

කාමරයේ උෂ්ණත්වයට සාපේක්ෂව වැඩි කාලයක අවශ්‍යතාව වේ ✓ එසේ සමතුලිත සාන්ද්‍රණය $CaSO_4$ ට සාපේක්ෂව ඉතා අඩු නිසා අයනික ගුණිතය එසේ ✓ $BaSO_4$ වල ද්‍රාව්‍ය සාන්ද්‍රණය $CaSO_4$ වල ද්‍රාවණ සාන්ද්‍රණයට වඩා වැඩි (+) අගයක් ගනී. ✓ එමනිසා $CaSO_4$ ට සාපේක්ෂව $BaSO_4$ වල ද්‍රාව්‍යතාවය ඉතා අඩුයි. ✓

(05 × 6 = 30)

(ii) $K_{sp} = [Ba^{2+}_{aq}][SO_4^{2-}{}_{aq}]$ (05)

$= (9 \times 10^{-6}\ mol\ dm^{-3})^2$

$= 8.1 \times 10^{-11}\ mol^2\ dm^{-6}$ (05)

b → 40.

(c) (1) $K_a = \dfrac{[HCOO^-_{aq}][H^+_{aq}]}{[HCOOH_{aq}]}\ mol\ dm^{-3}$ (10)

(2) $[H^+_{aq}] = [HCOO^-_{aq}]$ (05)

$K_a = \dfrac{[H^+_{aq}]^2}{[HCOOH_{aq}]}$ (05)

$[H^+] = \sqrt{K_a \times [HCOOH_{aq}]}$ (05)

අම්ලයේ විඝටනය ඉතා කුඩා නිසා අම්ලයේ සමතුලිත සාන්ද්‍රණය ආරම්භක සාන්ද්‍රණයට සමාන ලෙස සැලකේ. (05)

$[H^+_{aq}] = \sqrt{1.77 \times 10^{-4} \times 0.05}$

$= 2.97 \times 10^{-3}\ mol\ dm^{-3}$

$(\simeq 3 \times 10^{-3}\ mol\ dm^{-3})$ (05)

8

(3) $\dfrac{[H^+_{aq}]}{[HCOOH_{aq}]} \times 100 = \dfrac{2.97 \times 10^{-3}}{0.05} \times 100$

$= 5.94\%$ $(\simeq 6\%)$ (05)

(4) $pH = -\log_{10}[H^+_{aq}]$ (05)

$= -\log_{10} 2.97 \times 10^{-3}\ mol\ dm^{-3}$

$= \underline{\underline{2.52}}$ (05)

(II)

(1) $HCOOH_{aq} + Mg_{(s)} \longrightarrow (HCOO)_2Mg_{aq} + H_{2(g)}$

හෝ

$(2H^+_{aq} + Mg_{(s)} \longrightarrow Mg^{2+}_{aq} + H_{2(g)})$ (05)

(2) $H^+_{aq}$ මවුල ගණන $= 0.05\ mol\ dm^{-3} \times \dfrac{20}{1000}\ dm^3$

$= 1 \times 10^{-3}\ mol$ (05)

$H_{2(g)}$ මවුල ගණන $= \frac{1}{2} \times 1 \times 10^{-3}\ mol$

$= 0.5 \times 10^{-3}\ mol$ (05)

$H_2$ පරිමාව $= 0.5 \times 10^{-3} \times 22400 = 11.2\ cm^3$ (05)

(3) ශීඝ්‍රතාවය $\propto [H^+_{aq}]$

$HCOOH_{(aq)}$ දුබල ලෙස හෙවත් / භාගිකව විඝටනය වේ (05)

(4) $H^+_{aq}$ , $H_{2(g)}$ ලෙස ඉවත්වන විට සමාන $H^+_{aq}$ ප්‍රමාණයක් HCl වලින් මෙන් නොවේ. නමුත් ප්‍රතික්‍රියාවට සමාන මුළු ප්‍රමාණයක් ලෙසට ලැබේ. (05)

$c \rightarrow 60$.

| Q 6 = 150 |
|---|

(07) (à)

(I) $2S_2O_3^{2-} \longrightarrow S_4O_6^{2-} + 2e$ } [illegible] අවශ්‍ය නැත.

$2e + I_2 \longrightarrow 2I^-$

$2Na_2S_2O_3 + I_2 \longrightarrow Na_2S_4O_6 + 2NaI$ (5)

$6I^- + 16H^+ + 2CrO_4^{2-} \longrightarrow 3I_2 + 2Cr^{3+} + 8H_2O$ (10)

$Pb^{2+} + CrO_4^{2-} \longrightarrow PbCrO_4$ (S) (5)

(II) $Na_2S_2O_3$ මවුල = $0.051\ mol\ dm^{-3} \times \frac{11.22}{1000}\ dm^3$ (5)

$I_2$ මවුල = $0.051 \times \frac{11.22}{1000} \times \frac{1}{2}$ mol (5)

$CrO_4^{2-}$ මවුල = $0.051 \times \frac{11.22}{1000} \times \frac{1}{2} \times \frac{2}{3}$ mol (5)

∴ Pb මවුල = $0.051 \times \frac{11.22}{1000} \times \frac{1}{2} \times \frac{2}{3}$ mol (5)

Pb ස්කන්ධය = $0.051 \times \frac{11.22}{1000} \times \frac{1}{2} \times \frac{2}{3} \times 207\ g\ mol^{-1}$ (5)

Pb ස්කන්ධ ප්‍රතිශතය = $0.051 \times \frac{11.22}{1000} \times \frac{1}{2} \times \frac{2}{3} \times \frac{207 \times 100}{0.759}$ (5)

= 5.202 % (5 සිට 5.5 දක්වා) (5)

a → 55

(b)(1) 298 K උෂ්ණත්වයේදී $[H^+] = 1\ mol\ dm^{-3}$ වන ජලීය ද්‍රාවණයක් තුළ පීඩනය 1atm වන $H_{2(g)}$ Pt ලෝහ පෘෂ්ඨය මතදී $H^+_{(aq)}$ සමඟ සමතුලිතව පවතින ඉලෙක්ට්‍රෝඩය වේ. (6)

(2) i ඇනෝඩය Zn (2) කැතෝඩය - හයිඩ්‍රජන් ඉලෙක්ට්‍රෝඩය (2)

ii ඇනෝඩයේ $Zn^{2+}_{(aq)} + 2e \rightleftharpoons Zn_{(s)}$ (5)

කැතෝඩයේ $2H^+_{(aq)} + 2e \rightleftharpoons H_{2(g)}$ (5)

iii $Zn_{(s)} + 2H^+_{(aq)} \longrightarrow H_{2(g)} + Zn^{2+}_{(aq)}$ (5)

iv $Zn_{(s)} | Zn^{2+}_{(aq, 1\ mol\ dm^{-3})} || H^+_{(aq, 1\ mol\ dm^{-3})} | H_{2\ (g, 1atm)} | Pt_{(s)}$ (10)

v $E^\theta = E^\theta_C - E^\theta_A$

$= 0 - (-0.76V)$

$= +0.76V$ // (5)

vi * Zn ලෝහය ඇති ද්‍රාවණයට ජලය එකතු කිරීම. (5)

* $H^+$ ඇතුළු ද්‍රාවණයට conc HCl එකතු කිරීම.

(C) i ද්‍රාවණයේ $f(A---A) = f(B---B) = f(A---B)$ වේ ✓ එම නිසා පරිපූර්ණ ද්‍රාවණයක් ලෙස හැසිරේ ✓ (10)

ii රාවුල් නියමය යොදා ගැනීමෙන් ✓

$P_T = P_A + P_B$ ✓

$3\times10^5\ Pa = 4\times10^5 x_A + 2.5\times10^5(1-x_A)$ ✓

$x_A = 1/3$ // ✓

එම නිසා $x_B = 1 - \frac{1}{3} = 2/3$ // ✓ 2×5 = (10)

iii $P_A = P_A^o x_A$ ✓

$P_A = 4\times10^5\ Pa \times \frac{1}{3} = \frac{4}{3}\times10^5\ Pa$ ✓

$P_A = P_T \times Y_A$ ✓

$Y_A = P_A/P_T$ ✓ $= \frac{4\times10^5}{3\times3\times10^5} = \frac{4}{9}$ // ✓ 2×5 = (10)

(8) (a) A = $CH_3-CH(OH)-CH_3$  B = $CH_3-CH=CH_2$  C = $CH_3-CHBr-CH_3$

D = $CH_3-CH(MgBr)-CH_3$  E = $CH_3-C(OMgBr)(CH_3)-CH(CH_3)-CH_3$  F = $CH_3-C(OH)(CH_3)-CH(CH_3)_2$

G = $CH_3-CBr(CH_3)-CH(CH_3)_2$  ⓜ. 7 × 5 = (35)

$R_1$ = I $LiAlH_4$ II $H_2O$  $R_2$ = සා $H_2SO_4/170°$  $R_3$ = HBr

$R_4$ = Mg / වියළි ඊතර්  $R_5$ = $CH_3COCH_3$  $R_6$ = තනුක අම්ලය

$R_7$ = HBr හෝ $PBr_3$  $R_8$ = $NH_3$

ⓜ. 8 × 3 = (24)

(b) $C_2H_4 \xrightarrow{Br_2(l)} CH_2Br-CH_2Br \xrightarrow{ම. KOH} C_2H_2 \xrightarrow{Na (ද්‍රව NH_3)} H-C\equiv C^-Na^+$

$C_2H_4 \xrightarrow{HBr} CH_3CH_2Br$

$H-C\equiv C^-Na^+ + CH_3CH_2Br \rightarrow H-C\equiv C-CH_2CH_3$

$H-C\equiv C-CH_2CH_3 \xrightarrow{Hg^{2+}/ත. H_2SO_4} CH_3-CO-CH_2CH_3$

ⓜ. 11 × 5 = (55)

(c) i $C_2H_5OH$ හා $CH_3CH_2CH_2OH$

↓ සා $H_2SO_4/\Delta$

$C_2H_4$   $CH_3CH=CH_2$

↓ තනුක $H_2SO_4$

$C_2H_5OH$   $CH_3-CH(OH)-CH_3$

↓ සා. $ZnCl_2$ / සාන්ද්‍ර HCl

ආවිලතාවයක් නැත   මිනිත්තු 5 කට පසු ආවිලතාවය

**හෝ**

$C_2H_5OH$ හා $CH_3CH_2CH_2OH$

↓

$C_2H_4$   $CH_3CH=CH_2$

↓ $Br_2/CCl_4$

$CH_2Br-CH_2Br$   $CH_3-CHBr-CH_2Br$

↓ මධ්‍ය KOH

$C_2H_2$   $CH_3-C\equiv CH$

↓ $Hg^{2+}$/ත. $H_2SO_4$

$CH_3CHO$   $CH_3COCH_3$

රිදී කැඩපත ↓ $H^+/KMnO_4$ —

ⓜ. 2 × 9 = (18)

12

ii $CH_3NH_2$ සහ $CH_3CONH_2$

↓ $NaOH/\Delta$

පිටවන වායුව

තෙත් රතු ලිට්මස් කඩදාසිය

↓

රතු ලිට්මස් කඩදාසිය නිල් පැහැ වේ

@ $3 \times 3 = (9)$

iii



↓ $NH_4OH / AgNO_3$

රිදී දර්පණයක් ලැබේ

@ $3 \times 3 = (9)$

(9) (a) I $A = Ag^+$ $B = Al^{3+}$ @ (10)

II $1 - Ag_2O$ $3 - Al(OH)_3$ @ (10)

(b) I සුදු පැහැති $P_{4(s)}$ කහ පැහැති $S_{8(s)}$ කොළ පැහැති $Cl_{2(g)}$ @ $3 \times 3 = (9)$

II ද්‍රවාංක $Cl_2 < P_4 < S_8$ @ (9)

III * අණුක ස්කන්ධ වැඩිවීම අනුව $Cl_2 < P_4 < S_8$ ලෙස වැඩිවේ

* එම නිසා වැන්ඩර්වාල්ස් බල ශක්තිය වැඩි වේ ... $Cl_2 < P_4 < S_8$ ලෙස වැඩිවේ

* එම නිසා ද්‍රවාංක ද ඒ පිළිවෙලට වැඩිවේ. @ $6 \times 2 = (12)$

IV $P - PH_3$ දුබල භාෂ්මික

$S - H_2S$ දුබල ආම්ලික

$Cl - HCl$ ප්‍රබල ආම්ලික @ $6 \times 3 = (18)$

13

v $6NaOH + 4S \longrightarrow 2Na_2S + Na_2S_2O_3 + 3H_2O$

$2H_2SO_4 + S \longrightarrow 3SO_2 + 2H_2O$ @ (20)

vi $6KOH + 3Cl_2 \longrightarrow 5KCl + KClO_3 + 3H_2O$

$8NH_3 + 3Cl_2 \longrightarrow N_2 + 6NH_4Cl$ @ (20)

(c) i ද්‍රාව්‍යතාව අඩුවන පිළිවෙල $BeSO_4 > MgSO_4 > CaSO_4 > SrSO_4 > BaSO_4$ @ (10)

* ධ්‍රැවීකරණ බලය. ✓
* කාණ්ඩය පහළට කැටායනයේ ප්‍රමාණය වැඩිවේ. ✓
* එවිට කාණ්ඩය පහළට සල්ෆේටවල දැලිස් ශක්තිය ✓ සහ සජලන ශක්තිය ✓ අඩු වේ.
* නමුත් දැලිස් ශක්තිය අඩුවීමට වඩා, සජලන ශක්තිය අඩුවීම වැඩි වේ ✓
* ∴ කාණ්ඩය පහළට ... ද්‍රාව්‍යතාව අඩුවේ. ✓

@ 2×6 = (12)

ii ද්‍රාව්‍යතාව $LiI < LiBr < LiCl < LiF$ @ (10)

* කැටායනය සමාන වේ ✓
* ධ්‍රැවීකරණ ... සමාන වේ. ✓
* ප්‍රමාණය $F^- < Cl^- < Br^- < I^-$ ✓
* ධ්‍රැවීකරණ ... $F^- < Cl^- < Br^- < I^-$ ✓
* ... $LiI < LiBr < LiCl < LiF$ ✓

∴ ද්‍රාව්‍යතාව වැඩිවේ.

@ 5×2 = (10)

(10) (a) i $IO_3^- + 5I^- + 6H^+ \longrightarrow 3I_2 + 3H_2O$

$I_2 + 2Na_2S_2O_3 \longrightarrow 2NaI + Na_2S_4O_6$ @ $10 \times 2 = (20)$

II. $n_{Na_2S_2O_3} = 0.1\,mol\,dm^{-3} \times \frac{20}{1000}\,dm^3 = 2 \times 10^{-3}\,mol$ ✓

$n_{I_2} = 1 \times 10^{-3}\,mol$ ✓

$n_{H^+} = 2 \times 10^{-3}\,mol$ ✓

500 cm³ ක ඇති $n_{H^+} = \frac{2 \times 10^{-3} \times 500}{25} = 0.04\,mol$ ✓

50 cm³ ක ඇති $n_{H^+} = 0.04\,mol$ ✓

∴ සාන්ද්‍රණය $[H^+] = \frac{0.04\,mol}{50 \times 10^{-3}\,dm^3}$ ✓

$= 0.8\,mol\,dm^{-3}$ ✓ @ $05 \times 7 = (35)$

(b) i $[CrCl_4]^-$ නිල් දම්

ii $[Fe(H_2O)_6]^{3+}$ - ලා දම

iii $[Co(NH_3)_6]^{3+}$ කහ දුඹුරු

iv $[CoCl_4]^{2-}$ නිල්

v $[Cu(NH_3)_4]^{2+}$ නිල්.

@ $10 \times 5 = (50)$

(c) i $Fe^{2+}$, $NH_4^+$, $SO_4^{2-}$. @ $3 \times 3 = (9)$

ii $C = NH_3$, $J = NH_4Cl$, $K = BaSO_4$ @ $3 \times 3 = (9)$

iii $[Fe(H_2O)_6]^{2+}$, $[Fe(H_2O)_6]^{3+}$ @ $3 \times 2 = (6)$

iv $F = Fe(OH)_2$ $G = Fe(OH)_3$ @ $3 \times 2 = (6)$

v $(NH_4)_2SO_4 + 2NaOH \longrightarrow Na_2SO_4 + 2NH_3 + 2H_2O$ — (5)

$2[Fe(H_2O)_6]^{3+} + Zn \longrightarrow 2[Fe(H_2O)_6]^{2+} + Zn^{2+}$ — (10)